(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 100.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 නොවැම්බර් 13 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1350/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මාර්ග පුළුල් කළ යුතු තත්ත්වයක පවතින බවත්;

(ii) කින්නියා ප්‍රදේශයේ ජනගහනය සහ එම ප්‍රදේශයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයන් සංඛ්‍යාව අනුව කින්නියා-කොළඹ ප්‍රධාන මාර්ගය ප්‍රමුඛත්වයදී පුළුල් කළ යුතු බවත්;

(iii) එම මාර්ගයට ආසන්නව පාසැල් පිහිටා තිබෙන අතර අධික රථවාහන තදබදයක් තිබෙන බවත්, පදිකයන්ට ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කින්නියා-කොළඹ ප්‍රධාන මාර්ගයේ පළල කොපමණද;

(ii) එම මාර්ගය එක් දිශාවකට පමණක් වාහන ගමන් කළ හැකි මාර්ගයක්ද;

(iii) නොඑසේ නම්, දිශාවන් දෙකටම වාහන ගමන් කළ හැකි මාර්ගයක්ද;

(iv) ඉහත මාර්ගය පුළුල් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, යෝජිත මාර්ගයේ දිග සහ පළල කොපමණද;

(vi) ඒ සඳහා ඇස්තමේන්තු කර ඇති වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1352/2025

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල තහනම් පන්න ක්‍රම සහ අනවසර ධීවර යාත්‍රා භාවිතා කරමින් නීති විරෝධී ධීවර කටයුතු සිදු කරන බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඒ සඳහා නිරීක්ෂණ සහ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට ඉදිරියේදී ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත නීති විරෝධී ධීවර කටයුතු —

(i) හේතුවෙන් මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගුණාත්මක මත්ස්‍ය නිෂ්පාදනයට ඇතිවූ බලපෑම කවරේද;

(ii) හේතුවෙන් එම දිස්ත්‍රික්කවල ධීවරයන්ගේ ආර්ථිකට සිදුවූ බලපෑම සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) හේතුවෙන් පීඩාවට පත්වූ සාමාන්‍ය ධීවරයන්ගේ ජීවනෝපාය මාර්ග සහ ඔවුන්ගේ ආදායම් සුරක්ෂිත කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) මැඩලීමට ප්‍රමාණවත් පරිදි නීතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(v) මැඩලීම සඳහා ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා පොලීසිය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1354/2025

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින විශ්‍රාම වැටුප්ලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2020 වර්ෂයේ සිට මේ දක්වා විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පවුල් ඒකකයක් ලෙස සැලකීමේදී විශ්‍රාමිකයෙකුගේ විශ්‍රාම වැටුප, පුද්ගල ප්‍රතිලාභයකට වඩා පොදු ප්‍රතිලාභයක් ලෙස සලකනු ලබන බව පිළිගන්නේද;

(ii) ඒ අනුව, විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයෙක් මිය යාමෙන් පසු ඔහුගේ/ඇයගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියා පටිපාටිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1395/2025

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් සහ ලාහුගල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල උග්‍ර පානීය ජල හිඟයක් පවතින බවත්;

(ii) එම පානීය ජල හිඟයට විසඳුමක් ලබා දීමේ අරමුණින් 2018, 2019 සහ 2020 වර්ෂවලදී පිළිවෙළින් රුපියල් මිලියන 150ක්, 25ක් සහ 50ක් වැය කරමින් එවකට පැවති රජයන් විසින් 'හැඩඔය' ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානීය ජල හිඟයට විසඳුමක් ලෙස ක්‍රියාත්මක කරන ලද ඉහත ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ඉහත (අ)(i)හි සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජීවත් වන ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට හැකි බැවින් එම ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1434/2025

ගරු ඕෂානි උමංගා මහත්මිය,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදලට අදාළ දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් 2024 ඔක්තෝබර් මස සිට සේවා යෝජකයන්ට දැනුම් දීමට කම්කරු දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබේද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නොගෙවීම සම්බන්ධයෙන් අධිභාර පැනවීමේ නිවේදන නිකුත් කර ඇති කාල සීමාව කොපමණද;

(iii) දීර්ඝ කාලයක සිට අධිභාර අය කර ගැනීම ප්‍රමාදවී තිබේ නම්, ඊට හේතු කවරේද;

(iv) 2019 පාස්කු ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ 2022 ආර්ථික අර්බුදය හේතුවෙන් අභියෝගයට ලක්වූ ව්‍යාපාරවලට අධිභාර පැනවීමේදී සහන ලබා දීමට කටයුතු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(5)හි විධිවිධාන ප්‍රකාරව, 2025 නොවැම්බර් 15 සෙනසුරාදා, 17 සඳුදා, 18 අඟහරුවාදා, 19 බදාදා, 20 බ්‍රහස්පතින්දා, 21 සිකුරාදා, 22 සෙනසුරාදා, 24 සඳුදා, 25 අඟහරුවාදා, 26 බදාදා, 27 බ්‍රහස්පතින්දා, 28 සිකුරාදා, 29 සෙනසුරාදා සහ 2025 දෙසැම්බර් 01 සඳුදා, 02 අඟහරුවාදා, 03 බදාදා සහ 05 සිකුරාදා "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධාන ප්‍රකාරව, "විසර්ජන" පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 17 සඳුදා, 24 සඳුදා සහ 2025 දෙසැම්බර් 01 සඳුදා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන” පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 15 සෙනසුරාදා, 18 අඟහරුවාදා සිට 20 බ්‍රහස්පතින්දා දක්වා ද, 22 සෙනසුරාදා, 25 අඟහරුවාදා සිට 27 බ්‍රහස්පතින්දා දක්වා ද, 29 සෙනසුරාදා සහ 2025 දෙසැම්බර් 02 අඟහරුවාදා, 03 බදාදා යන වෙන් කළ දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, “විසර්ජන” පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 නොවැම්බර් 21 සිකුරාදා සහ 28 සිකුරාදා යන වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00 ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) සහ (6) ඡේදවල විධිවිධාන ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 4),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75(2)හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, “විසර්ජන” පනත් කෙටුම්පත (2026) සලකා බැලීම සඳහා 2025 දෙසැම්බර් 05 සිකුරාදා වෙන් කළ දිනයෙහි පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.00 සිට අ.භා. 12.30 දක්වා ද අ.භා. 1.30 සිට අ.භා. 6.00 දක්වා ද විය යුතු ය. අ.භා. 6.00ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — (පස්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 නොවැම්බර් 07) [1].

*2.

සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග,— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18(3) වගන්තියේ (ඊ) ඡේදය සමඟ කියවිය යුතු 50 වගන්තිය යටතේ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— රුහුණු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2024.12.17 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රුහුණු විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2025.02.18 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.08.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.07 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව (2023),— 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය හා 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටස යටතේ 2025.02.22 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.08.06 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව (2022),— 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය පනතේ 19 වගන්තිය යටතේ 2024.07.23 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2017),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2022.01.20 දින ඉදිරිපත් කරන ලද, 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2022.02.22 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2022.02.24 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා,— වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික වාර්තාව (2018),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.01.20 දින ඉදිරිපත් කරන ලද, 2018.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් වී අලෙවි මණ්ඩලයේ 2018 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(කෘෂිකර්ම කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2019),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*15.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2020),— 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වගන්තිය යටතේ 2025.01.07 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*16.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව (2022/2023),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2025.02.20 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.03.05 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.03.10 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*17.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ VI වන කොටසේ 29 වගන්තිය යටතේ 2025.05.09 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.11 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.08.06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*18.

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා,— ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව (2022),— 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 31 වගන්තිය යටතේ 2024.12.18 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික තරුණ සේවා සභාවේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තරුණ කටයුතු සහ ක්‍රීඩා පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2025.06.13 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.06.17 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*19.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2022),— 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2023.12.01 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*20.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වාර්ෂික වාර්තාව (2023),— 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 10(8) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.05.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*21.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2022),— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2024.07.23 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*22.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තාව (2023),— 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 32 වගන්තිය යටතේ 2025.04.09 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.06.18 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.07.08 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*23.

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*25.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— "2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රැඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරික්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---